[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 06 ශ්‍රේණිය | විද්‍යාව | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ..................................................................................................................................................................

**සැළකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**
- **1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01). පහත ද්‍රව්‍ය අතරින් ජීවී ද්‍රව්‍ය පමණක් ඇති පිළිතුර තෝරන්න,
1). ළමයා, අඹගස, පොත
2). පූසා, මෑ වැල, පොල් ගස
3). පොත, ගිරවා, බල්ලා
4). ජලය, බයිසිකලය, පූසා

02). සංචරණයක් හෝ චලනයක් දක්නට නොලැබෙන්නේ,
1). මුහුදු මල
2). නිදිකුම්බා
3). හැකරැල්ලා
4). බයිසිකලය

03). රූපයෙන් පෙන්නුම් කරන්නේ ජීවියකු සතු කුමන ලක්ෂණයද?




1). වර්ධනය
2). ප්‍රජනනය
3). පෝෂණය
4). ශ්වසනය

04). තන්තු කම්පනයෙන් ශබ්දය නිපදවෙන සංගීත භාණ්ඩ ඇතුලත් පිළිතුර වන්නේ,
1). ගිටාරය, සිතාරය
2). උඩැක්කිය, දවුල
3). බටනලාව, ගිටාරය
4). හක්ගෙඩිය, බටනලාව

05). යම් වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය හඳුන්වන්නේ,
1). ස්කන්ධය ලෙස
2). බර ලෙස
3). පරිමාව ලෙස
4). ඝනත්වය ලෙස

06). නිදහසේ එල්ලා ඇති දණ්ඩ චුම්බකයක උත්තර ධ්‍රැවය සෑමවිටම යොමු වන්නේ,
1). පෘථිවියේ උතුරටය
2). පෘථිවියේ බටහිරටය
3). පෘථිවියේ දකුණටය
4). පෘථිවියේ නැගෙනහිරටය.

07). සමාන ජල පරිමා විවිධ හැඩයේ භාජන හතරක ඇති අයුරු පහත දැක්වේ. මින් පැහැදිලි කළ හැක්කේ,




1). ජලයට නිශ්චිත හැඩයක් ඇති බවයි.
2). ජලය ඕනෑම භාජනයකට දැමිය හැකි බවයි.
3). ජලය අඩංගු භාජනයේ හැඩය ගන්නා බවයි.
4). ජලය ද්‍රව අවස්ථාවේ පවතින බවයි.

08). රිද්මයානුකූල අවිධිමත් ශබ්ද හඳුන්වන්නේ,..............................ලෙසය.
1). දෝංකාරය
2). ඝෝෂාව
3). සංගීතය
4). හඬේ සැර

09). A – ශාකවල ආහාර නිෂ්පාදනය
B – පෙනීම ලබාදීමට
C – මාර්ග සංඥා නිකුත් කිරීමට
ඉහත ප්‍රකාශ අතුරින් ආලෝකයේ ප්‍රයෝජනයක් වන්නේ,
1). A පමණි 2). A හා B පමණි 3). B හා C පමණි 4). A , B, C සියල්ල.

**10 සහ 11 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන උපයෝගී කර ගන්න.**



10). ඉහත ක්‍රියාකාරකමේදී ලැබෙන නිරීක්ෂණ අනුපිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.
1). අයිස් → ජල වාෂ්ප → ජලය
2). ජලය → අයිස් → ජල වාෂ්ප
3). ජල වාෂ්ප → ජලය → අයිස්
4). අයිස් → ජලය → ජල වාෂ්ප

11). ඉහත අවස්ථා විපර්යාස සිදුවන්නේ ඉටිපන්දම් දැල්ලෙන් ලැබෙන,
1). තාපය නිසාය 2). උෂ්ණත්වය නිසාය
3). ආලෝකය නිසාය 4). ස්පර්ශය නිසාය

12). ප්‍රශ්වාස වාතයේ වැඩිපුර අඩංගු වන වායුව වන්නේ,
1). කාබන්ඩයොක්සයිඩ් වායුව 2). ඔක්සිජන් වායුව
3). නයිට්‍රජන් වායුව 4). හයිඩ්‍රජන් වායුව

13). චුම්බකයක චුම්බක ගුණ වැඩියෙන්ම පවතින ස්ථාන වන්නේ,
1). උත්තර ධ්‍රැවයේ ය. 2). චුම්භකයේ මැදය
3). දක්ෂිණ ධ්‍රැවයේ ය. 4). ධ්‍රැව දෙකෙහිය.

14). මුහුදු රළ වල ඇති ශක්තිය නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵලයකි.
1). විද්‍යුත් ශක්තිය නිපදවා ගත හැකි වීම.
2). මුහුදු වෙරළ සුන්දර වීම
3). මුහුදේ පාවෙන විදුලි බලාගාර ඇති කිරීමට හැකිවීම
4). සුනාමි තත්ව ඇතිවීම

15). විවිධ සංඥා නිකුත් කිරීමට ආලෝකය යොදා ගන්නා අවස්ථා ඇත. බොහෝ විට අනතුරක් හැඟවීමට යොදා ගන්නේ,
1). රතු ආලෝකය 2). කොළ ආලෝකය 3). නිල් ආලෝකය 4). කහ ආලෝකය

16). පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් අපට පරිභෝජනය කළ හැකි ජල ප්‍රතිශතය වන්නේ,
1). 0.01% 2). 70% 3). 97.14% 4). 10%

17). භූගත ජලය පවතින ආකාරයකි.
1). සාගර ජලය 2). පොකුණු ජලය 3). උල්පත් ජලය 4). ගංගා ජලය

18). ගල් අඟුරු, පෙට්‍රෝලියම් තෙල් වර්ග, පෙට්‍රෝලියම් වායු ආදී සියල්ලම,
1). ජෛව ඉන්ධන වේ. 2). පොසිල ඉන්ධන වේ.
3). ජෛව ස්කන්ධ වේ. 4). භූතාප ශක්තීන් වේ.

19). කලපු වල අඩංගු ජලය හඳුන්වන්නේ,
1). කරදිය 2). මිරිදිය 3). කිවුල්දිය 4). බොරදිය


20). ශාක සහ සතුන් අතර නිවැරදි වෙනස්කමක් ලෙස සැලකිය හැක්කේ,
1). සතුන්ට ආහාර අවශ්‍ය නමුත් ශාකවලට ආහාර අවශ්‍ය නොවීම.
2). සතුන්ට ආහාර හා ජලය අවශ්‍ය නමුත් ශාකවලට ආහාර හා ජලය අවශ්‍ය නොවීම.
3). ශාක චලනය නොකරන නමුත් සතුන් චලනය කිරීම.
4). ශාක ආහාර නිපදවන නමුත් සතුන් ආහාර නිපද වීමක් නොකිරීම.

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. A) 06 ශ්‍රේණියේ සිසුන් පිරිසක් සිදුකරන ලද සරල ක්‍රියාකාරකමක් පහත දැක්වේ.

- විනිවිද පෙනෙන පළල් කුඩා වීදුරු බෝතල් කිහිපයක් ගෙන එක් එක් බෝතලයට පිළිවෙලින් පැණි, පැණි බීම, ජලය, භූමිතෙල්, දැවුනු එන්ජින් ඔයිල් වැනි ද්‍රව කිහිපයක් දැමීම.
- පහත රූපයේ දැක්වෙන ආකාරයට දැල් වූ ඉටිපන්දම ඉදිරියේ බෝතලය තබා බෝතලයේ ඇති ද්‍රව්‍ය තුලින් ඉටිපන්දම් දැල්ල නිරීක්ෂණය කිරීම.



රූපය 5.4

i). ඉහත නිරීක්ෂණ ඇසුරින් පහත වගුව පුරවන්න.

| ආලෝකය සහ ඉටිපන්දම් දැල්ල හොඳින් පෙනෙන ද්‍රව | ආලෝකය දැකිය හැකි නමුත් ඉටිපන්දම් දැල්ල පැහැදිලිව නොපෙනෙන ද්‍රව | ආලෝකය සහ ඉටිපන්දම් දැල්ල නොපෙනෙන ද්‍රව |
|---|---|---|
| ................................<br>................................ | ......................................<br>...................................... | ................................<br>................................ |

(ල : 03)


ii). ආලෝකය ප්‍රචාරණය සිදුවන ආකාරය අනුව ද්‍රව්‍ය ප්‍රධාන වර්ග 3කට බෙදිය හැක. සුදුසු වචන යොදා පහත හිස්තැන් පුරවන්න.

a). ආලෝකය ක්‍රමවත්ව එහා මෙහා ගමන් කරන ද්‍රව්‍ය.................................

b). ආලෝකය අක්‍රමවත්ව ගමන් කරන ද්‍රව්‍ය...............................................

c). ආලෝකය ගමන් නොකරන ද්‍රව්‍ය......................................................... (ල : 03)

B)




i). පළමු ක්‍රියාකාරකමේ දී PVC නලය තුළින් දාදු කැටය දෙස බැලීමේ දී ,

a). ලැබෙන නිරීක්ෂණය කුමක්ද? (ල : 01)

b). එයට හේතුව කුමක්ද? (ල : 01)

ii). දෙවන ක්‍රියාකාරකමේ දී

a). ලැබෙන නිරීක්ෂණය කුමක්ද? (ල : 01)

b). එයට හේතුව කුමක්ද? (ල : 01)

iii). එම නිරීක්ෂණවලට අනුව ගත හැකි නිගමනය කුමක්ද? (ල : 01)

iv). පහත සඳහන් වාක්‍ය තනි වචනයකින් හෝ වචන දෙකකින් හඳුන්වන්න.

a). ආලෝකය නිකුත් කරන වස්තු.........................................

b). තමා විසින්ම ආලෝකය නිකුත් කරන වස්තු.........................................

c). තමා විසින් ආලෝකය නිකුත් නොකරන වස්තු.......................................

d). ඊ හිස සහිත සරල රේඛාවකින් නිරූපණය වේ. .......................................

e). ආලෝක කිරණ රාශියක එකතුව......................................................... (ල : 05)

02. A) කණ්ඩායම් ක්‍රියාකාරකමකදී පරිසරය නිරීක්ෂණය කළ ශිෂ්‍ය කණ්ඩායමක නිරීක්ෂණ කිහිපයක් පහතින් දක්වා ඇත.

a). ගසක අතු සුළඟට සෙලවීම.

b). නිදිකුම්බා පත්‍ර අතින් ඇල්ලූ විට හැකිලීම.

c). කාමරයක් තුල ජනේලයක් අසල ඇති පෝච්චියක සිටු වූ ශාකයක ශාක කඳ ආලෝකය දෙසට නැමී වැඩීම.

d). වැලක ඇති රෙදි සුළඟට සෙලවීම.

e). ලේනකු ගසක ඇති අඹ ගෙඩියක් ආහාරයට ගැනීම.

i). ඉහත නිරීක්ෂණ අතරින් ශාක චලන දැක්වෙන අවස්ථා 02ක් ලියන්න. (ල : 02)


ii). මෙහි අජීවී ද්‍රව්‍ය සම්බන්ධ නිරීක්ෂණය කුමක් ද? (ල : 01)

iii). ලේනා තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක්ද? (ල : 01)

iv). ලේනාගේ සංචරණ උපාංග මොනවාද? (ල : 01)

v). ශාක සහ සතුන් වර්ධනයේ දී පෙන්වන වෙනස්කම කුමක්ද? (ල : 01)

vi). පහත දැක්වෙන දෙබෙදුම් සුවිය පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.




(ල : 05)

03. A) සුදුසු වචන වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

**(ප්‍රත්‍යස්ථ/ මාලිමාව/ ග්ලැසියර්/ සෝඩියම් ක්ලෝරයිඩ්/ පාරභාසක/ හැකරැල්ලා/ ස්කන්ධය/ විජලනය/ පෝෂණය/ක්ෂුද්‍ර ජීවීන්/ ආලෝක)**

i). ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය.........................................යි.

ii). පියවි ඇසින් දැකිය නොහැකි ජීවීන් ....................................නම් වේ.

iii). ...............................................සංචරණ උපාංග බොහෝ ඇති ජීවියෙකි.

iv). අවකාශයේ ඉඩක් නොගන්නා ස්කන්ධයක් නොමැති දෙයකි..............................ශක්තිය.

v). යම් ද්‍රව්‍යයක අඩංගු පදාර්ථ ප්‍රමාණය එහි ..................................නම් වේ.

vi). ධ්‍රැවාසන්න ප්‍රදේශ වල ..................................... ලෙස පවතින්නේ ඝන අවස්ථාවේ ඇති ජලයයි.

vii). ශරීරයෙන් අධික ලෙස ජලය ඉවත් වීමෙන් ශරීරය ..........................................වී මරණයට වුවද පත් විය හැක.

viii). කෑමට ගන්නා ලුණුවල අඩංගු රසායනික සංයෝගය...............................ය.

ix). ළදරු සුප්පු තැනීමට රබර් යොදාගන්නේ රබර් සතු.......................................ගුණය නිසාය.

x). දුමෙන් පිරි වාතය...................................ද්‍රව්‍යක් ලෙස හැසිරේ.

xi). නාවිකයන්ට හා ගුවන් නියමුවන්ට යා යුතු දිශාව සොයා ගැනීම සඳහා ............................උදව්වේ.

(ල : 11)

04. A) i). පහත සඳහන් චුම්බක හැඩය අනුව වර්ග කරන්න.




(ල : 02)

ii). පහත දී ඇති චුම්බක එකිනෙක ආසන්නයට ගෙන ඒමේ දී ඇති වන්නේ ආකාර්ෂණයක් ද? විකර්ෂණයක්ද?

a) [N | S] → ← [N | S]


b) [N | S] → ← [S | N]

c) [S | N] → ← [N | S]

d) [S | N] → ← [S | N]

(ල : 04)

iii). රූපයේ දැක්වෙන්නේ ලී ආධාරකයක් මත සවිකල සැහැල්ලු සමනලයෙකි.




ලී දණ්ඩට සවිකළ A චුම්බකය සමනළයා සහිත ට්‍රොලිය වෙතට ළං කළ විට එය පසු පසට තල්ලු වී යයි.

a) ඒ අනුව B කුමක් විය යුතු ද? (ල : 01)

b) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල : 01)

c) A හි අග්‍ර මාරු කර නැවත ට්‍රොලිය අසලට ගෙන ආ විට කුමක් සිදුවේද? (ල : 01)

d) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල : 01)

iv). චුම්බක භාවිතා කර ඇති සාදා ඇති උපකරණ 2ක් නම් කරන්න. (ල : 01)

05. A) ඕනෑම කාර්යයක් සිදු කිරීම සඳහා ශක්තිය අවශ්‍ය වේ. එදිනෙදා ජීවිතයේ දී ශක්තිය පරිභෝජනය වන විවිධ අවස්ථා ඇති අතර මෙහිදී භාවිතා කරන ශක්ති ප්‍රභව ද විවිධ වේ.

i). පහත දැක්වෙන එක් එක් අවස්ථාවලදී භාවිතා කරන ශක්ති ප්‍රභවය බැගින් ඉදිරියෙන් ලියන්න.

a) මිරිස් වේලීම b) වාහන ධාවනය c) ජලය රත් කිරීම (ල : 03)

ii). ඈත අතීතයේ දී මිනිසා භාවිතා කළ ශක්ති ප්‍රභව 2ක් ලියන්න. (ල : 01)

iii). දිනෙන් දින ශක්ති පරිභෝජනය වැඩි වීමට හේතුවක් සඳහන් කරන්න. (ල : 01)

iv). ඉතා සීඝ්‍රයෙන් අවසන් වෙමින් පවතින ශක්ති ප්‍රභවයක් නම් කරන්න. (ල : 01)

v). සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

**(සූර්යයා/ න්‍යෂ්ටික/ සුළං/ ජෛව ස්කන්ධ/ ශක්තිය)**

a) දර, පොල්කටු ආදිය..................................සඳහා නිදසුන් වේ.
b) කාර්යය සිදු කිරීම සඳහා ............................................. අවශ්‍ය වේ.
c) දැනට ශ්‍රී ලංකාවේ විදුලිය නිපදවීම සඳහා ..........................ද්‍රව්‍ය භාවිතා නොකරයි.
d) අප ගන්නා ආහාර වල ගබඩා වී ඇත්තේ .......................................ගේ ශක්තියයි.
e) සුළං විදුලි බලාගාරයක ඩයිනමෝ කරකැවීමට යොදාගන්නේ ....................ශක්තියයි.


(ල : 05)

06. A) පහත දැක්වෙන වගන්ති සත්‍ය නම් (✓) ලකුණ ද අසත්‍ය නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

i). මීදුම සහිත අවස්ථාවලදී වාතය පාරභාසක වේ. ( )
ii). පෘථිවි පෘෂ්ඨයෙන් 70% කටත් වඩා අපට පරිභෝජනය කළ හැකි ජලය ඇත. ( )
iii). සියලුම ක්ෂුද්‍ර ජීවීන් අපට ලෙඩ රෝග ඇති කරයි ( )
iv). අවර්ණ හුණු දියර කිරි පැහැ වන්නේ කාබන් ඩයොක්සයිඩ් වායුව නිසාය. ( )
v). වෛද්‍ය පරීක්ෂණ කටයුතු වලදී ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණය කිරීමට එන්ඩොස්කෝප් උපකරණය යොදා ගනී. ( )
vi). චන්ද්‍රයා දීප්ත වස්තුවකි. ( )
vii). වායුගෝලයේ ජලය පවතින්නේ ජලවාෂ්ප ලෙසයි. ( )
viii). ද්‍රව්‍ය කම්පනය වීමෙන් ශබ්දය ඇති වේ. ( )
ix). ඉන්ධන ලෙස භාවිතා කළ හැකි ශාක හා සත්ව ද්‍රව්‍ය ජෛව ස්කන්ධ වේ. ( )
x). ශබ්දය අධික වූ විට සංගීත නාදය වුවද පීඩාකාරී විය හැක. ( )
xi). සජාතීය චුම්බක ධ්‍රැව අතර ආකර්ශණ බල ඇති වේ. ( )

(ල : 11)

07. A) රබානක් මතට කුඩා සෑජු ෆෝම් කැබලි දමා ඇත.



i). එම රබානට සෙමින් තට්ටු කිරීමේ දී,
a) නිරීක්ෂණය කුමක්ද?
b) එම නිරීක්ෂණයට හේතුව කුමක් ද? (ල : 03)
c) ධ්වනිය නිපදවන භාණ්ඩ හඳුන්වන නම කුමක්ද?

ii). ශබ්දය සඳහා සංවේදී ඉන්ද්‍රිය කුමක් ද? (ල : 01)

iii). අවට පරිසරයේ අපට අසන්නට ලැබෙන විවිධ වර්ගයේ ශබ්ද කිපයක් පහතින් දැක්වේ.

- සුළඟේ ශබ්දය
- දිය ඇල්ලක ශබ්දය
- මෝටර් රථයක හඬ
- ගුවන් යානයක හඬ
- පාසලේ සීනු හඬ
- කුරුළු නාදය

ඉහතින් දක්වා ඇති ශබ්ද ස්වභාවිකව ඇතිවන ශබ්ද හා කෘත්‍රිමව ඇතිවන ශබ්ද ලෙස වර්ග කරන්න.

| ස්වභාවිකව ඇතිවන ශබ්ද | කෘත්‍රිමව ඇතිවන ශබ්ද |
|---|---|
| | |

(ල : 03)

iv). රිද්මයකට අනුව ගැයෙන හෝ වැයෙන ශබ්ද හැඳින්විය හැක්කේ කෙසේද? (ල : 01)
v). නාගරික පරිසරයකදී ඔබට ඇසිය හැකි ඝෝෂාකාරී ශබ්ද 2ක් ලියන්න. (ල : 01)
vi). පහතින් දක්වා ඇති එක් එක් ආකාරයට ශබ්දය නිපදවන සංගීත භාණ්ඩ 2 බැගින් ලියන්න.
a) තත් පෙලීම මගින්
b) වායු කඳන් කම්පනය මගින් (ල : 02)

**දෙවන වාර ඇගයීම 2023**
**විද්‍යාව - 6 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

**I පත්‍රය**

1) – 2
2) – 4
3) – 1
4) – 1
5) - 1
6) – 1
7) – 3
8) – 2
9) – 4
10) – 4
11) – 1
12) – 1
13) – 4
14) – 4
15) - 1
16) – 1
17) – 3
18) – 2
19) – 3
20) – 4

1) A) i) අදාළ පිළිතුරු වලට (ල. 03)
ii) a) පාරදෘශ්‍ය ද්‍රව්‍ය
b) පරභාෂක ද්‍රව්‍ය
c) පාරාන්ධ ද්‍රව්‍ය (ල. 03)
B) i) a - දාදු කැටය නොපෙනීම (ල. 01)
b - ආලෝකය නොලැබීම (ල. 01)
ii) a - දාදු කැටය පෙනේ (ල. 01)
b - ආලෝකය හොඳින් ලැබීම (ල. 01)
iii) පෙනීම සඳහා ආලෝකය අත්‍යවශ්‍ය බව (ල. 01)
iv) a - ආලෝක ප්‍රභව
b - දීප්ත වස්තු
c - අදීප්ත වස්තු
d - ආලෝක කිරණ
e - ආලෝක කදම්බ (ල. 05)

2) i) – b / c (ල. 02)
ii) – a (ල. 01)
iii) - පෝෂණය (ල. 01)
iv) - පාද (ල. 01)
v) - ශාක - වර්ධනය අසීමිතය
සතුන් - වර්ධනය සීමිතය (ල. 01)
vi) අදාළ පිළිතුරු වලට (ල. 05)

3) i) පෝෂණය
ii) ක්ෂුද්‍ර ජීවින්
iii) හැකරැල්ලා
iv) ආලෝක
v) ස්කන්ධය
vi) ග්ලැසියර්
vii) විජලනය
viii) සෝඩියම් ක්ලෝරයිඩ්
ix) ප්‍රත්‍යස්ථ
x) පරභාසක
xi) මාලිමාව
(ල. 1 x 11 = 11)

4) i) A - බුරුළු චුම්බක C – U හැඩැති චුම්බක
B - දණ්ඩ චුම්බක D - පෙති චුම්බක

ii) a - ආකර්ෂණ
b - විකර්ෂණ
c - විකර්ෂණ
d - විකර්ෂණ

iii) a - චුම්බකයකි (ල. 01)
b - චුම්බකයක සජාතීය ධ්‍රැව විකර්ෂණය වේ. (ල. 01)
c - ආකර්ෂණය වේ. (ල. 01)
d - චුම්බකයක විජාතීය ධ්‍රැව ආකර්ෂණය වේ. (ල. 01)

iv) අදාළ උපකරණ වලට (ල. 01)

5) A) i) a - සූර්යයා b - ඉන්ධන c - ජෛව ස්කන්ධ (ල. 03)
ii) සුළඟ , සූර්යයා (ල. 01)
iii) ජනගහන වර්ධනය (ල. 01)
iv) පොසිල ඉන්ධන (ල. 01)
v) a - ජෛව ස්කන්ධ c - න්‍යෂ්ටික e - සුළඟ
b - ශක්තිය d - සූර්යයා (ල. 05)

6) i. ( √ ) vii. ( √ )
ii. ( × ) viii. ( √ )
iii. ( × ) ix. ( √ )
iv. ( √ ) x. ( √ )
v. ( √ ) xi. ( × )
vi. ( × ) (ල. 1 x 11 = 11)

7) A) i. a - කුඩා කඩදාසි කැබලි චලනය වීම. (ල. 01)
b - රබානේ සම්පටලය කම්පනය (ල. 01)
c - ධ්වනි ප්‍රභව (ල. 01)
ii. කන (ල. 01)
iii. අදාළ පිළිතුරට (ල. 03)
iv. සංගීත නාද (ල. 01)
v. අදාළ පිළිතුරට (ල. 01)
vi. a / b අදාළ පිළිතුරට (ල. 02)